# 15. පිළිවෙළ

ලෝකය දෙස අපි නෙත් යොමමු
අහසේ ලස්සන දෙස බලමු
මේ හැම අප හට අත්කර දුන්
අල්ලාහ්ගේ ගුණ අපි දකිමු





පන්ති කාමරයට නෙත් යොමමු
ලස්සන පුටු පෙළ දෙස බලමු
සිසුන්ගේ ඉගෙනුම් උපකරණ
වෙන ම තබා ඇති හැටි දකිමු

යුතුකම් සතුටින් ඉටු කරමු
හිමිකම ඇති ලෙස එය කරමු
විගස ගැනීමට හැකි වන සේ
නිසි දේ නිසි තැන අපි තබමු

සැම දෙන සතුටින් පිළිගන්නේ
ගුණවත් අය මේ ලෙස ඉන්නේ
ඒ ගැන දැන ජීවත් වන්නේ
අල්ලාහ් අප හැම රැක ගන්නේ

## පැවරුම්

පහත සඳහන් වැකිවල අදහස් හරි නම් "✓" ලකුණ ද වැරැදි නම් "✕" ලකුණ ද යොදන්න.

1. අල්ලාහ් අහස ලස්සනට මවා ඇත. ( )
2. අල්ලාහ්ගේ මැවුම්වල අලංකාර බවක් ද, පිළිවෙළක් ද දක්නට ඇත. ( )
3. උයනක මල් පැළ පිළිවෙළට සිටුවා ඇත. ( )
4. කඩ සාප්පුවල බඩු පිළිවෙළට අසුරා ඇත. ( )
5. කුස්සියේ වළං තැන් තැන්වල දමා ඇත. ( )
6. නිසි තැන නිසි ද්‍රව්‍ය තිබෙන නිසා අවශ්‍ය වෙලාවට අවශ්‍ය දේ ගැනීම පහසු ය. ( )